# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,673—1959 පෙබරවාරි 23 වැනි සඳුදා—23.2.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

පහත පෙනෙන උප ලෙඛනයේ සඳහන් නියෝග මවිසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි :—

ඩී. පී. ආර්. ගුණවර්ධන.
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1959 පෙබරවාරි මස 20 දින,
කොළඹ දීය.

උපලේඛනය

| දිනය | නියෝගය දුන් බලධාරියා | නියෝගයේ බලපවත්වන ද්‍රව්‍ය | නියෝගය පළ කළ ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 27.1.59 | ... මිළ (ආහාර) පාලක ... | අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ) ... ... | 59.1.27 දින අංක 11,653. |
| 28.1.59 | ... මිළ (ආහාර) පාලක ... | එඑමස් ... ... | 59.1.28 දින අංක 11,654. |

## මිල පාලන දැන්වීම්

**අංක ටී. 1/59 දරණ ආහාර මිළ නියෝගය**

**අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

ආහාර නියෝජ්‍ය මිල පාලක තැන්පත් ඇන්ටන් රොත්වෙල් මැකෙයිසර් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වැනි වගන්තියෙන් ආහාර නියෝජ්‍ය මිළ පාලක කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958ටෙ සැප්තැම්බර් 17 වැනි දින අංක 11,529 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958ටෙ සැප්තැම්බර් 17 වැනි දින අංක ටී/13/58 දරණ ආහාර මිළ නියෝගයේ පළමු වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව 2, 3 සහ 4 වැනි තීරවල දක්වෙන මිළ තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද මෙම නියෝගයෙන් 1959යේ පෙබරවාරි 1 වැනි දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති පළමු වැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් හා සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ පළමු වැනි උප ලෙඛනයේ 2, 3 සහ 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් 1959යේ පෙබරවාරි 1 වැනි දින සිට වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

577—ජේ. ඇන්. ආර් 445—4,250 (2/59)

(3) මීට යාකර ඇති පළමුවැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ 2 වැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදෙශයන්හි සිල්ලර වශයෙන් විකිණීමේදී විකිණිය හැකි වැඩිම මිළ රාත්තලක්, ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සහා ප්‍රදෙශය තුළ විකිණීම සඳහා යොදු ඇති පළමු වැනි උප ලෙඛනයේ 3 වැනි තීරයේ සඳහන් මිළ 2 වැනි උප ලෙඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ සමග වැඩි කිරීමෙන් බවත්—

(4) මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) තොග වෙළඳාම යනුවෙන් අදහස් කරනුයේ පළමු වැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය එකම අවස්ථාවකදී දළ බර හොණ්ඩරයක් හෝ වැඩි ගණනක් විකිණීම හෝ යළිත් විකිණීමය ;

(ආ) පළමු වැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය දළ බර හොණ්ඩරයකට අඩු ගණනක් පාරිභොගය සඳහා හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ පාලනය වන සෑම ප්‍රදෙශයකම පළමු වැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමීත්වයේ හෝ පාලනය යටතේ යම්කිසි ස්ථානයක හෝ වාහනයක තබාගෙන සිටින යෑම වෙළෙන්දකුම එකී ද්‍රව්‍යය සම්බන්ධයෙන් මෙම නියෝගය නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ පාලනය වන සෑම ප්‍රදෙශයකම පළමු වැනි උප ලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(7) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) මෙම නියෝගයෙන් වැඩිම මිළ පාලනය වන සෑම ප්‍රදෙශයක්ම උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකුම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණු දිනය ;
(ආ) විකුණු උම්බලකඩ ප්‍රමාණය බර ;
(ඇ) විකුණු ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග, ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(9) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිලත් වැඩිම තොග මිළ හෝ සිල්ලර මිළ ගණන්වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1959යේ පෙබරවාරි 17 දින අ : හා : 3ට ත්‍රිකුණාමල කච්චේරියේදී අත්සන් කෙළෙමි.

ඇන්ටන් ආර්. මැකෙයිසර්,
ආහාර නියෝජ්‍ය මිල පාලක තැන.

## 1 වැනි උපලෙඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | ත්‍රිකුණාමල නගරයේ සහ කඩවත් කරවන ආදායම් නිළ ධාරි තැනගේ කොට්ඨාශය තුළ හොණ්ඩරයක වැඩිම තොග මිළ | ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සහා කොට්ඨාශය තුළ ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිල | කොඩ්ඩියාර් පත්තුව හා තම් පලගමුව පත්තුව කරවන නිළධාරීන්ගේ කොට්ඨාශය තුළ දළ බර හොණ්ඩරයක වැඩිම තොග මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ ... ... | 243 0 ... | 2 43 ... | 244 40 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකියි.

## 2 වැනි උපලෙඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය |
|---|---|
| ගම්මුලාදෑනි කොට්ඨාශය | පළමුවැනි උපලෙඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය ත්‍රිකුණාමලයේ පළාත් ආණ්ඩු සහා ප්‍රදේශයේ විකුණන මිළ වැඩි කළ හැකි මිළ |
| | ශත |
| උප්පුවෙලිය, සාම්බල්තිව් ... ... ... ... ... | නැහැ |
| චීන් වරාය, වෙල්ලමනල්, තඹලගමුව සහ නිලාවෙලිය ... ... ... | 01 |
| සින්න කින්නියාව, පෙරිය කින්නියාව, කුරුන්වාන්කර්නි, උප්පාර්, කන්තලේ, මුතූර්, අක්කරෙයිවේනෙයි, සම්පූර්, මල්ලිකෙයිතිව්, කිලිවෙට්ටි, තෝප්පූර්, පල්ලිකුඩිඉරිප්පු සහ කුඹුරුපිටි ... ... | 02 |
| කුනිතිව්, ඊච්චලම්පත්තෙයි, කුච්චවලි, පණිකැටියාව සහ ගෝමරන්කඩවල ... ... | 03 |
| තිරියාව, මැදවච්චිය සහ හල්කඩවල ... ... ... ... ... | 04 |
| පුල්මුඩ්ඩෙයි ... ... ... ... ... | 05 |
| තෙන්නමරවාඩි සහ පරණ මැදවච්චිය ... ... ... ... | 06 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී.